(51)

මගේ අංකය : ස.සේ.කො./5/1/iii වෙළුම,
සමුපකාර සේවක කොමිෂන් සභාව (වයඹ),
නව පළාත් සභා ගොඩනැගිල්ල, දෙවන මහල,
කුරුණෑගල.
2019.03. 08

වයඹ පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිති,
පළාත් සමූපකාර ග්‍රාමීය බැංකු සංගමය හා
වයඹ සමූපකාර මහා සංගමය, ස.ණ.ස.සංගම්,
ස.ණ.ස. සමිති, වෙනත් සමිති හා සංගම් වල ගරු සභාපති හා
සාමාන්‍යාධිකාරී වරුන් වෙත,

## සමූපකාර සේවක කොමිෂන් සභා 1/2015 චක්‍රලේඛය සඳහා අන්තර්ග්‍රහණය කිරීම.

සමූපකාර සේවකයින් සඳහා 2000.07.01 දිනට පෙර ක්‍රියාත්මක වූ සියළුම වැටුප් චක්‍රලේඛ සම්බන්ධයෙන් තනතුරු සඳහා ශ්‍රේණි වර්ගීකරණයක් කර නොතිබුණි. නමුත් 2000.07.01 දින සිට ක්‍රියාත්මක කරන ලද 1/2001 චක්‍රලේඛයේ සමහර තනතුරු සඳහා ශ්‍රේණි ක්‍රම 3ක් ද,(111,11,හා 1) තවත් සමහර තනතුරු සඳහා ශ්‍රේණි ක්‍රම 2 ක් ද, (11 හා 1) වශයෙන් තනතුරු ශ්‍රේණිගත කර තිබුණි.

2. ඉන් අනතුරුව 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි 8/2008 චක්‍රලේඛය නිකුත් කර ඇති අතර, එහිදී සියළු තනතුරු 111,11 හා 1 ලෙස ශ්‍රේණි වර්ගීකරණයක් කර ඇත. 1/2015 චක්‍රලේඛය ද උක්ත පරිදිම ශ්‍රේණි වර්ගීකරණයක් කර ඇත. නමුත් 1/2001, 8/2008 හෝ 1/2015 යන චක්‍රලේඛ තුනම ක්‍රියාත්මක වන අවස්ථාවේ සේවයේ යෙදී සිටින සේවකයින් ශ්‍රේණි සඳහා අන්තර්ග්‍රහණය කරන්නේ කෙසේද යන්න පිළිබඳව ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

3. ඒ අනුව උසස්වීම් ලබා දීමේදී තනතුරු ශ්‍රේණිගත කිරීම සම්බන්ධයෙන් සීමිත කාල පරාසයන් තුළ සේවයට බැඳුනු කාර්යමණ්ඩල අතර විශාල වැටුප් වෙනසක් නිර්මාණය වී ඇති අතර, ඉහල විධායක හා පහල මට්ටම් වල තනතුරු දරණ සේවකයන් අතර විශාල වැටුප් විෂමතාවයක් නිර්මාණය වී ඇත. එම විෂමතාවය නිවැරදි කිරීම සඳහා පහත පරිදි කටයුතු කරන ලෙසට මින් උපදෙස් දෙමි.

4. 8/2008 චක්‍ර ලේඛයට අදාල 01/2012 උසස්වීම් චක්‍රලේඛය මගින් වසර 10 කට වරක් ක්‍රියාත්මක උසස්වීම් ක්‍රමයම 1/2015 චක්‍රලේඛය සඳහාද පදනම් වී ඇති බව පෙන්වා දෙමි.

5. ඒ අනුව අදාල වැටුප් පියවරේ තැබීමට පෙර සේවකයින් කුමන ශ්‍රේණියකට බඳවාගෙන තිබුනද, ඔවුන්ගේ සේවා කාලය පදනම් කොට ගෙන 111,11හා 1 ශ්‍රේණි සඳහා 2015.03.01 දින සිට පහත පරිදි අන්තර්ග්‍රහනය සිදුවිය යුතුය.

5. (1) <u>111 ශ්‍රේණිය සඳහා</u>

2015.03.01 දිනට පෙර යම් තනතුරක හෝ iii, ii, i යන කුමන ශ්‍රේණියක හෝ මුළු සේවා කාලය වසර 10 ක් හෝ ඊට අඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සියළුම සේවකයින්, 111 ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කල යුතුය.

5. (11) <u>11 ශ්‍රේණිය සඳහා</u>

2015.03.01 දිනට පෙර මුළු සේවා කාලය යම් තනතුරක වසර 10 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 20 කට වඩා අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාල කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති හා අනෙකුත් සේවා අවශ්‍යතාවයන් සම්පූර්ණ කර ඇති සියළුම සේවකයින් 11 ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කල යුතුය.

5. (111) <u>I ශ්‍රේණිය සඳහා</u>

2015.03.01 දිනට පෙර යම් තනතුරක වසර 20 ක් හෝ ඊට වැඩි කාලයක් සම්පූර්ණ කර ඇති අදාළ කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති හා අනෙකුත් සේවා අවශ්‍යතා සම්පූර්ණ කර ඇති සියළුම සේවකයින් I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කළ යුතුය.

6. මෙම චක්‍රලේඛයට පටහැනිව සිදුකර ඇති සියලු වැටුප් පරිවර්තන හා උසස්වීම් අවලංගු විය යුතු අතර සියලුම වැටුප් පරිවර්තන 1/2015 චක්‍රලේඛය හා මෙම චක්‍රලේඛ උපදෙස් අනුවම සිදු කල යුතු වේ. මෙම චක්‍රලේඛ උපදෙස් වලට පටහැනිව මින් පරිබාහිරව සිදුකරනු ලබන වැටුප් ගෙවීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය/කාරකසභාව වගකිව යුතු වේ.

7. <u>උසස්වීම්</u>

අදාල තනතුරේ හෝ මුළු සේවා කාලය පදනම් කරගනිමින් සියළුම තනතුරු සඳහා උසස්වීම් සිදුකරනු ලබන අතර, ඉහත පරිදි කටයුතු සිදු කිරීමට හා ශ්‍රේණි සඳහා අන්තර්ග්‍රහනය කිරීමට අදාල එම තොරතුරු ද, මීට පරිබාහිරව ඔබ සමිතියේ උසස්වීම් හා අන්තර්ග්‍රහනයන් සිදුකර ඇත්නම් එම තොරතුරු සංශෝධනය සඳහා ද, මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීමේදී යම් ගැටළුකාරී තත්වයක් පැනනගින්නේ නම් ඒ පිළිබඳ සියළු තොරතුරුද, සමුපකාර සේවක කොමිෂන් සභාව වෙත යොමු කරන ලෙස දැනුම් දෙමි.

8. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් ගේ එකඟතාවය ඇතිව බව ද දැනුම් දෙමි.

කොමිෂන් සභා නියමය පරිදි,

රේණුකා පී. විජේරූප.
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව (වයඹ)

O/C 2019.03.08

<u>පිටපත්</u>- :

1. ප්‍රධාන ලේකම් - වයඹ පලාත. - කා. දැ.පි.
2. ලේකම්, සමුපකාර සංවර්ධන, වෙළඳ,ඉඩම්,විදුලිබල හා බල ශක්ති , ක්‍රීඩා හා යෞවනකටයුතු, සංස්කෘතික, කලා කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය (වයඹ) - කා. දැ.පි.
3. සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ටාර්(වයඹ පලාත) - දැ.ගැ.පි - අ.ක.ස.
4. සියළුම සමුපකාර සේවක කොමිසන් සභා ලේකම්වරු - දැ.ගැ.පි.- අ.ක.ස.
5. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් - කුරුණෑගල,හලාවත,කුලියාපිටිය,මහව. - දැ.ගැ.පි.- අ.ක.ස.